# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/29 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WEG/LAN/L8/ACQ/54.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 380A ගුරුබැබිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගුරුබැබිල (මිදිගම) ගමේ පිහිටි ක.සි. අංක 820108 මතු සඳහන් ඉඩම් මිදිගම පොළ පුළුල් කිරීම සඳහා අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

01. කැබලි අංක 1
ඉඩමේ නම: උස්බණ්ඩරවත්ත; හිමිකම් කියන්නා: ඩී. එල්. මර්වින් ජානක ගුණසේකර; ප්‍රමාණය: හෙක්: 0.0343.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් 2024.10.30 වැනි දින පෙ.ව. 10.00 ට වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 ඔක්තෝබර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ටී. එල්. එන්. එස්. මෙන්ඩිස්,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0163




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

අගලවත්ත ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 04/01/12/11(11).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/15/2017/VE/25.

ඉහත ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.02.23 දිනැති අංක 2320/64 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව ලෙස 2023 අප්‍රේල් මස 03 වැනි දින පෙ.ව 10.30 වශයෙන් සඳහන් කර ඇති අතර එම දිනය ඉකුත් වී ඇති බැවින් එම පරීක්ෂණ දිනය හා වේලාව සංශෝධනය විය යුතුය.

**සංශෝධනය**

ඒ අනුව ඉඩමට/ පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 දෙසැම්බර් මස 30 වැනි දින පෙ.ව. 10.30 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

**සඳරේඛා නිල්මිණී වෙල්ගම,**
ප්‍රාදේශීය ලේකම්,
අගලවත්ත.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0164

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.